

# හරිතාගාර වායු

හරිතාගාර වායු පිටවීමේ ප්‍රමාණය 1970 සිට 2004 දක්වා 70% කින් ඉහළ ගොස් තිබේ. ඒ අනුව ටෝන් බිලියන 28.7 සිට 49 දක්වා වූ කාබන්ඩයොක්සයිඩ් හෝ ඒ සමාන විෂ වායු ප්‍රමාණයක් මේ කාලය තුළ වායුගෝලයට එකතු වී ඇත. 1990 සිට 2004 දක්වා එහි වැඩි වීම 28% කි.

**ගාමිණී දිසානායක**

මෙසේ වායුගෝලයට එකතු වන විෂ-වායු ප්‍රමාණයෙන්3/4 ක් ම කබොන්ඩයොක්සයිඩ් (CO2) බව ගණන් බලා තිබේ. එය 1970 සිට 80% කින් ද 1990 සිට 28% කින් ද වැඩි වී ඇත.

වැඩිම පිටවීම වාර්තා වී තිබෙන්නේ බලශක්ති සැපයීමේ (ENERGY SUPPLY) ක්‍රියාවලිය තුළිනි. 1970 සිට 2004 දක්වා කාලය තුළ එය 145% කි. ප්‍රවාහණ කටයුතු වල දී එය 120% කි. ගෝලීය ආදායම වැඩි වීමත් සමඟ බලශක්ති නිෂ්පාදනය ද විශාල වශයෙන් වැඩි විය.

ඒ හා සමඟ ඉහළ ගිය ලෝක ජනගහනයට අනුරූපව තෙල්, ගල් අඟුරු හා වායු (GAS) පරිභෝජනය ද ඉහළ ගියේ ය.

දැනට පවතින ප්‍රවණතාවන් අනුව හා 2000 දී පැවැති ප්‍රමාණයට සාපේක්ෂව 2030 වන විට මෙකී විෂවායු පිටවීමේ ප්‍රමාණය 25% සිට 90% දක්වා වූ ප්‍රමාණයකින් ඉහළ යනු ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල වැඩි වීම 2/3 සිට 4/3 දක්වා වූ ප්‍රමාණයකින් දක්නට ලැබුණ ද දියුණු රටවල ඒක පුද්ගල පිටකිරීම් හා සසඳන විට එය ඉතා අඩු මට්ටමක පවතී. සංවර්ධනය වූ රටවල ජනගහන වර්ධනය 20% ක සීමාව තුළ පවත්වා ගෙන යෑමට සැලසුම් කර ඇතත්

ඔවුන් විසින් පිටකරනු ලබන හරිතාගාර වායු ප්‍රමාණය 46% කින් වැඩි වී ඇත.

ගණන් බලා ඇති පරිදි පිටකිරීම්වල මිලියනයකින් කොටසක් (PPm) කාබන්ඩයොක්සයිඩ් ($CO_2$ හෝ ඒ හා සමාන දේ වෙයි.

කාර්මික යුගයට පෙර, කාබන්ඩයොක්සයිඩ්($CO_2$)ඉතා කිට්ටු වශයෙන් PPm 278කි. 2005 දී එය PPm379 කි. වාර්ෂිකව එයPPm 2 කින් වැඩි වේ.

පෘථිවියේ උෂ්ණත්වය 1906 සිට වාර්ෂිකව සෙල්සියස් අංශක 0.74 කින් වැඩි වේ.

අවධාරණය කර තිබෙන පරිදි අපට පෘථිවියේ උණුසුම පාලනය කිරීම සඳහා නව තාක්ෂණය උපයෝගී කරගත හැකි වේ. මෙහි දී මිනිසා විසින් ඉදිරි 50 වසර තුළ දී පෘථිවියේ උණුසුම අවම කිරීම සඳහා හරිතාගාර වායුව පිටකිරීම අඩු කළ යුතු ය. මේ සඳහා වැය වන්නේ ලෝකයේ මුළු නිෂ්පාදනයෙන් ඉතා සුළු කොටසකි. IPCCවාර්තාව අනුව සෙල්සියස් අංශක 2 කින් මෙකී උෂ්ණත්වයේ ඉහළ නැගීම වැළැක්වීම සඳහා වාර්ෂිකව වැය වන්නේ සංවර්ධන වේගයේ ප්‍රතිශතයෙන්(GDP)0.12 කි. එහෙත් මෙසේ විෂවායු පිටවීම අවම කිරීම නොසලකා හැරියහොත් ඒ වෙනුවෙන් ගෙවන්නට සිදුවන වන්දිය ගෝලීය ආර්ථිකයෙන් විශාල කොටසකි. ජාතීන් 120 ක ගේ අවබෝධාත්මක කැමැත්තට එකඟව 2007 මැයි 04 දිනැති IPCCවාර්තාවේ සඳහන් කර තිබෙන හරිතාගාර වායුව පිටවීම අවම කිරීම සඳහා අනුමත ක්‍රියාමාර්ග

01. ගොඩනැගිලි, වාහන හා මුළුතැන් ගෙවල බලශක්ති කාර්යක්ෂමතාව වඩා තියුණු ලෙස වැඩි දියුණු කිරීම
02. තෙල්, පැට්‍රල් හා න්‍යෂ්ටික බලශක්තිය වෙනුවට සුළඟ විදුලිය හා සූර්ය ශක්තිය වැනි විකල්ප බලශක්ති සාධකවලට මාරුවීම.
03. අංගාරික විෂවායු උරාගැනීම (carbon sinks)සඳහා වනාන්තර ආරක්ෂා කිරීම
04. කෘෂිකාර්මික විෂ වායු පිටකිරීම් ආවරණය කිරීම

2015 දී හරිතාගාර වායුව පිටවීම සහතික වශයෙන් ම නතර කිරීමට කටයුතු කිරීම මෙකල අප මුහුණ පා සිටින හදිසි ම අභියෝගය වී ඇතැයි මෙම වාර්තාව සඳහන් කරයි. ඊළඟ අභියෝගය ලෙස සැලකෙන්නේ 2050 වන විට එය 85% කින් අඩු කිරීමට පියවර ගැනීමයි.

මෙකීIPCCවාර්තාව පිළියෙළ කිරීමට දායක වූ 2000 ට වැඩි විද්‍යාඥයන් ගේ අදහස අනුව, පෘථිවියේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 02 කින් ඉහළ යෑම වැළැක්වීම සඳහා හරිතාගාර වායුව නියමිත ප්‍රමාණයෙහි පවත්වා ගෙන යෑමට තිබෙන අවස්ථානුකූල අවබෝධය මෙය වේ.

මේ පිළිබඳ ලොව පුරා මීට අඩු උනන්දුවකින් කටයුතු කිරීමෙන් ඇතැම් විට පෘථිවියේ උෂ්ණත්වය තවත් වැඩි වී විශාල ආර්ථික විනාශයක් ඇති විය හැකි පරිදි මුහුදු ජල මට්ටම ඉහළ යෑම, සමහර ප්‍රදේශවල ජලගැලීම් හෝ නියඟ ද ඇති වී දශ ලක්ෂ සිය ගණනක ජනතාව පාරිසරික අනාථයන් බවට පත්වනු ඇත.

අලුත්ම IPCCවාර්තාව පිට වී දින කීපයකට පසුව, ආර්ක්ටික් කලාපයේ සාගර ජල මට්ටම පිළිබඳ නිරීක්ෂණය කළ විද්‍යාඥයන් ගේ ප්‍රකාශිකාවක්, කැනේඩියානු ගුවන් විදුලි සංස්ථා වේ "රේඩියෝ" 1 ට ප්‍රකාශයක් කරමින්, මෙම උෂ්ණ සෘතුවේ දී මුහුදු හිම මට්ටමක් දක්නට නොලැබෙන බවත් සීත සෘතුවේ දී ද බලාපොරොත්තු විය හැක්කේ ඉතා තුනී හිම තට්ටුවක් පමණක් බවත් කියා තිබේ. මෙකී ගුවන් විදුලි සේවයට වැඩිදුරටත් ඇය කියා ඇති පරිදි මේ සම්බන්ධයෙන් අප උනන්දුවෙන් ක්‍රියාත්මක නොවුනහොත් IPCCවාර්තාව කොතරම් මධ්‍යස්ථ වුව ද 2030 වන විට පෘථිවියේ උණුසුම් වීම සෙල්සියස් අංශක 04 කින් වැඩි වේ යැයි ඇල්ගෝර් තුළ පවතින විශ්වාසය ඊට බොහෝ කලින් සත්‍යයක් වනු ඇත.

පරිවර්තනය

**සිරිල් අභයගුණවර්ධන**

*IPCCවාර්තාව අනුව සෙල්සියස් අංශක 2 කින් මෙකී උෂ්ණත්වයේ ඉහළ නැගීම වැළැක්වීම සඳහා වාර්ෂිකව වැය වන්නේ සංවර්ධන වේගයේ ප්‍රතිශතයෙන් (GDP)0.12 කි. එහෙත් මෙසේ විෂවායු පිටවීම අවම කිරීම නොසලකා හැරියහොත් ඒ වෙනුවෙන් ගෙවන්නට සිදුවන වන්දිය ගෝලීය ආර්ථිකයෙන් විශාල කොටසකි.*

